# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 10 දරන
# ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පනත

---

[සහතිකය සටහන් කළේ 1984 මාර්තු මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : ශත 90 යි.

# 1984 අංක 10 දරන ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පනත

[සහතිකය සටහන් කළේ 1984 මාර්තු මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 24/83

**ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඉහතකී කාරණාවලට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 10 දරන ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය. එම දිනය මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලැබේ. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)*

## I වන කොටස

### ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පිහිටුවීම

2. ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව නමින් හඳුන්වනු ලැබිය යුතු (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර එය 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තත්කාලයේ සභාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. *(ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව පිහිටුවීම.)*

3. සභාව, 2 වන වගන්තිය මගින් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය. *(සභාව සංස්ථාවක් විය යුතු බව.)*

4. (1) සභාව, පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය, අර්ථශාස්ත්‍රය, මුදල්, අධ්‍යාපනය, ඉංජිනේරු විද්‍යාව, විද්‍යාව හෝ තාක්ෂණවේදය යන අංශවලට සම්බන්ධ කාරණා පිළිබඳ පළපුරුද්දක් ලබා ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් හැකියාවක් පෙන්නුම් කර ඇති බව ජනාධිපතිවරයාට පෙනී යන තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු තැනැත්තන් දස දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. *(සභාවේ සාමාජිකයෝ.)*

(2) ජනාධිපතිවරයා විසින් සභාවේ සාමාජිකයන්ගෙන් එක් කෙනකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන, සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය, සභාවේ සාමාජිකයන්ට ගෙවිය යුතු වන පාරිශ්‍රමික, සභාවේ රැස්වීම් සහ මුද්‍රාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

5. සභාවේ කාර්තව්‍ය සහ කාර්ය මෙසේ විය යුතු ය :— *(සභාවේ කර්තව්‍ය සහ කාර්ය.)*

(අ) පහත සඳහන් කාරණා, එනම් :—

(i) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

2—ජ 075121—6,250 (84/02)

(ii) ශ්‍රී ලංකා ජනතාවගේ ජීවන තත්ත්වය නගාලීමේ හා තාක්ෂණවේදීය වෙනස්වීම්වලින් එල්ලවන අභියෝගවලට මුහුණදීමට අවශ්‍ය හැකියාව ශ්‍රී ලංකාවට ලබාගැනීමට සැලැස්වීමේ පරමාර්ථය ඇතිව පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය ශ්‍රී ලංකාව තුළ භාවිතා කිරීම සහ යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම, පහසු කිරීම සහ ඊට සහායදීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග ;

(iii) ශ්‍රී ලංකාවට පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික පොදු කාර්ය සංවිධානය කිරීම සහ දියුණු කිරීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග ;

(iv) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදීය අධ්‍යාපනය, එහි සියලු අංශවලින් දියුණු කිරීම පිණිස ගත යුතු ක්‍රියාමාර්ග ;

(v) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදීය කර්මාන්තයේ නියුක්ත තැනැත්තන්ගේ දක්ෂතාව සහ දැනීම වැඩි දියුණු කිරීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග ;

(vi) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදී පිහිටුවීම්වල දත්තවල පූර්ණතාවය සහ ඒ පිහිටුවීම පිළිබඳ පෞද්ගලික තොරතුරු අනිසි ලෙස යෙදවීම සම්බන්ධයෙන් විශේෂ අවධානයකින් යුක්තව පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදී කර්මාන්තය විෂය යෙහි වෘත්තීය තත්ත්වයන් ඇති කිරීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග ;

(vii) ශ්‍රී ලංකාව තුළ පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදී කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය මිනිස්බල අවශ්‍යතා ගණනය කිරීම සහ ඒ තැනැත්තන් පුහුණු කිරීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග ;

(viii) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදී සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග

යන කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදයේ සියලු අංශ සම්බන්ධයෙන් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා පැවැත්වීම ;

(ඇ) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදයේ ඇතිවන දියුණුව සමීක්ෂණය කිරීම සහ ඒ දියුණුව ශ්‍රී ලංකාව තුළ ප්‍රයෝජනයට ගැනීම සඳහා යොදා ගැනීම ;

(ඈ) පරිගණක තොරතුරු තාක්ෂණවේදය හා සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම හා ප්‍රචලිත කිරීම හා ඒ විෂයයන් සම්බන්ධයෙන් මහජනතාවට අධ්‍යාපනය ලබාදීම ; සහ

(ඉ) සභාවේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා සහ ශ්‍රී ලංකාව තුළ පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය දියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් දේ කිරීම.

6. පහත සඳහන් දේ කිරීමේ බලය සභාවට තිබිය යුතු ය :— සභාවේ බලතල.

(අ) චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම හා දැරීම සහ එය විකිණීම, බදු දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම;

(ඇ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය සියලු ගිවිසුම් ඇති කර ගැනීම;

(ඈ) සභාව විසින් තීරණය කරනු ලබන සුරැකුම්වල සභාවේ මුදල් ආයෝජනය කිරීම;

(ඉ) පර්යේෂණ කාර්ය සඳහා පුස්තකාල හා පර්යේෂණාගාර තැනීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඊ) ලේකම් කාර්යාලයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(උ) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය හා ඊට සම්බන්ධිත විෂයයන් පිළිබඳ වාර්තා, වාර ප්‍රකාශන සහ ලියවිලි එකතු කිරීම, මුද්‍රණය කිරීම සහ පළ කිරීම;

(ඌ) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදය හා ඊට සම්බන්ධිත විෂයයන් ගැන දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම;

(එ) සභාවේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, බලපත්‍ර සහ අධිකාර අත්කර ගැනීම;

(ඒ) පරිගණක සහ තොරතුරු තාක්ෂණවේදයට සම්බන්ධ නිශ්චිත ව්‍යාපෘති පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම හෝ පැවැත්වීම සඳහා පුද්ගලයන්ට, විද්‍යාඥයන්ට හෝ යම් ආයතනයකට හෝ අධිකාරියකට ප්‍රදාන ලබා දීම;

(ඔ) සභාවේ කටයුතුවල යම් අංශයක් පිළිබඳව සභාවට සහාය වීමට ක්‍රියාකාරි කාරක සහ අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව පිහිටුවීම, ඒ කාරක සභාවල වැඩ විෂය ප්‍රමාණය හා අධිකාර නියම කිරීම සහ එම කාරක සභාවලට අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව තැනැත්තන් පත් කිරීම; සහ

(ඕ) සභාවේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් බලයක්, මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම.

## II වන කොටස

### සභාවේ කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධරයා.

7. (1) සභාපතිවරයා සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) සභාවේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, සභාපතිවරයාට, සභාවේ කටයුතු විධාන කිරීම, සභාවේ බලතල, කර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම හා ක්‍රියාවේ යෙදවීම සහ සභාවේ සේවා නියුක්තයන් පිළිබඳව පරිපාලනය හා ඔවුන් පාලනය කිරීම භාර කළ යුතු ය.

(3) සභාපතිවරයා විසින්, අවශ්‍ය යයි ඔහු අදහස් කරන කවර හෝ අවස්ථාවක, මේ පනතින් ඔහු වෙත පැවරී, නියම කරනු ලැබ හෝ වෙන් කර දෙනු ලැබ ඇති යම් බලයක්, කාර්යයක්, හෝ කර්තව්‍යයක් සභාවේ අනුමතය ඇතිව සභාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට ලියවිල්ලකින් පැවරිය හැකි අතර ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලය, කර්තව්‍යය හෝ කාර්යය සභාපතිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම ආදිය.

8. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් :—

(අ) සභාවේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන නිලධරයන් හා සේවකයන් පත් කිරීම ද ඔවුන්ගේ විනය පාලනය කිරීම ද ඔවුන් සේවයෙන් පහකිරීම ද කළ හැකි ය;

(ආ) ඒ නිලධරයන්ට හා සේවකයන්ට පාරිශ්‍රමික ගෙවන අනුප්‍රමාණ නියම කළ හැකි ය;

(ඇ) ඒ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කළ හැකි ය; තව ද

(ඈ) ඒ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් ක්‍රම හෝ යෝජනා ක්‍රම ඇති කිරීම හා විධිමත් කිරීම ද එවැනි යම් අරමුදල් ක්‍රමයකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම ද කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යමක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් සහ රාජ්‍ය සංස්ථාවල හා උසස් අධ්‍යාපන ආයතනවල නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

9. (1) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිස ගත් යම් තැනැත්තකු සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැදීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරනු ලබන කාලයක් වශයෙන් සැලකිය යුතු ය.

(5) සභාවේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලන මණ්ඩලයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව සභාව හා ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ වන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ නියමයන් හා කොන්දේසි ඇතුළු නියමයන් හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් තැනැත්තකු (5) වන උපවගන්තියේ විධිවිධාන අනුව සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනය වම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(7) සභාවේ ඉල්ලීම පිට, යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව සභාව හා ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟ වනු ලබන විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ කොන්දේසි ඇතුළු කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

(9) මේ වගන්තියේ "උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුම්වල 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් ඒවාට දී ඇති අර්ථයම ඇත්තේ ය.

## III වන කොටස

## මුදල්

සභාවේ අරමුදල.

10. (1) සභාවට සභාවේ අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සභාව ලබන්නා වූ සියලු මුදල්;

(ඇ) කවර වූ හෝ ප්‍රභවයකින් ණය, ප්‍රදාන, තෑගි හා දීමනා වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල්;

(ඈ) 12 වන වගන්තිය යටතේ අය කර ගනු ලබන සියලු මුදල්;

සහ

(ඉ) මේ පනතේ වෙනත් යම් විධිවිධානයකින්, අරමුදලට ගෙවීමට බලය දී ඇති හෝ නියමිත සියලුම මුදල්

සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

(3) මේ පනත යටතේ සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සභාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවීමට මේ පනතේ වෙනත් යම් විධිවිධානයකින් බලය දී ඇති හෝ නියමිත වෙනත් යම් වියදමක් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාවේ ණය ගැනීමේ බලතල.

11. මේ පනත යටතේ සභාවේ බැඳීම් පියවීම සඳහා හෝ සභාවේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා සභාවට අවශ්‍ය වන මුදල්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් සාමාන්‍ය අධිකාරයක නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව හෝ සභාව විසින් අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් තාවකාලිකව ණයට ලබා ගත හැකි ය:

එසේ වුවද මේ වගන්තිය යටතේ සභාව විසින් ලබා ගන්නා ලද යම් තාවකාලික ණය වෙනුවෙන් යම් අවස්ථාවක ගෙවිය යුතු මුදල් ප්‍රමාණවල එකතුව, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල් නොඉක්මවිය යුතු ය.

පරිගණක සහ ඊට සම්බන්ධ උපකරණ සඳහා සෙස් බද්ද.

12. (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම පරිගණක යන්ත්‍රයක් සහ ඊට සම්බන්ධ උපකරණ වෙනුවෙන්, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් කලින් කල තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් මත වූ සෙස් බද්දක් පනවා අය කර ලබා ගත යුතු ය.

(2) මේ වගන්තිය, එය රේගු ආඥාපනතේ කොටසක් වූ ලෙස අදාළ විය යුතු අතර එම ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(3) පරිගණක යන්ත්‍ර සහ ඒවාට සම්බන්ධ උපකරණ මත මේ වගන්තිය යටතේ අය කර ගනු ලබන සෙස් බද්දෙන් ලැබෙන මුදල් ප්‍රධාන රේගු අයකැමි විසින් සභාවේ අරමුදලේ බැරට ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය මගින් නියම කරනු ලබන්, පරිගණක යන්ත්‍ර හා ඒවාට සම්බන්ධ උපකරණ මත වූ සෙස් බද්ද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පරිගණක යන්ත්‍ර හා සම්බන්ධ උපකරණ සඳහා නියම කරන ලද යම් ආනයන බද්දකට අතිරේකව විය යුතු ය.

සභාවේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

13. (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සභාවේ ආදායම හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සභාව කටයුතු සැලසිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

බදු සහ තීරු බදුවලින් නිදහස් වීම.

14. (1) යම් භාණ්ඩ ආනයනය කිරීම් හෝ මිලයට ගැනීම සභාවේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සඳහා ප්‍රයෝජනවත් වෙතැයි අමාත්‍යවරයා විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, සභාව විසින් ආනයනය කරන ලද හෝ මිලට ගන්නා ලද එවැනි යම් භාණ්ඩ වෙනුවෙන් යම් රේගු බද්දක් හෝ තීරු බද්දක් ගෙවීමෙන් සභාව නිදහස් විය යුතු අතර ඔහු විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ නිදහස් කිරීම අනුමත කළ යුතු ය.

(2) මහ නගර සභා ආඥා පනත යටතේ පනවන ලද යම් වරිපනම් බදු ගෙවීමෙන්, සභාව නිදහස් විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

අමාත්‍යවරයාගේ විධාන.

**15.** ප්‍රතිපත්තිමය කාර්යවලට අදාළ වන තාක් දුරට සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් වූ සාමාන්‍ය හෝ විශේෂ විධාන, අමාත්‍යවරයා විසින් සභාව විමසා කලින් කල සභාවට ලිඛිතව නිකුත් කළ හැකි අතර සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරීම.

**16.** (1) සභාව විසින් මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය හා කර්තව්‍ය අතරින් කිසිවක් යම් රාජ්‍ය සංස්ථාවකට, සංවර්ධන සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට ලියවිල්ලකින් වූ නියමයක් මගින් පැවරිය හැකි ය:

එසේ වුවද සභාව විසින් නියමයක් කිරීම—

(අ) රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වූ විට, ඒ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර, නොකළ යුතු ය;

(ආ) සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් වූ විට, සංවර්ධන සභා විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර, නොකළ යුතු ය;

(ඇ) පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර, නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්, සභාව විසින් යම් අවස්ථාවක ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**17.** සභාවේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**18.** සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

රහස්‍ය භාවය පිළිබඳ ප්‍රකාශය.

**19.** සභාවේ සෑම සාමාජිකයකු ම ද සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන් ද තම කාර්ය ඉටු කිරීම ආරම්භ කිරීමට පෙර සභාවේ වැඩ කටයුතුවලට සම්බන්ධ සියලු කාරණා පිළිබඳව දැඩි රහස්‍යභාවය රැක ගැනීමට පොරොන්දුවීමේ ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර ඒ ප්‍රකාශය මගින්, පහත සඳහන් අවස්ථාවල දී හැර, ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුට දැන ගන්නට ලැබෙන කවර හෝ කාරණයක් අනාවරණය නොකිරීමට ද පොරොන්දු වී බැඳිය යුතු ය:—

(අ) එසේ කරන ලෙස අධිකරණයක් විසින් හෝ ඒ කාරණා වලට සම්බන්ධ යම් නැනැත්තකු හෝ පුද්ගල මණ්ඩල යක් විසින් නියම කරනු ලැබූ විට
සහ

(ආ) මේ පනතේ විධිවිධාන අතුරින් කිසිවකට අනුකූලව ක්‍රියා කිරීමේදී.

මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

20. (1) (අ) මේ පනත යටතේ සභාව විසින් සද්භාවයෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවට විරුද්ධව, හෝ

(ආ) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවක යකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාව යෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ සභාව විසින් හෝ සභාවට විරුද්ධව පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරනු ලැබූ යම් වියදමක් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාවට ගෙවනු ලබන හෝ සභාව විසින්, අයකර ගනු ලබන යම් ගාස්තු වක් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරි යේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඔහු විසින් දරන ලද යම් වියදම්, ඒවා එකී සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගන්නා ලද්දේ නම් මිස, සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයකුට පුද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

21. සභාවට විරුද්ධව පවරන ලද්දා වූ යම් නඩුවක දී සභාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

රීති සෑදීමට සභාව සතු බලය.

22. (1) මේ පනත මගින් රීති සෑදීමට බලය දී ඇති හෝ නියම කර ඇති සියලුම කාරණා හෝ ඒවායින් යම් කාරණාවක් සම්බන්ධ යෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන කිසිම රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

23. (1) සභාවේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ සහ ඒ කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, එම දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එපරිද්දෙන් අත්කර, සභාව වෙත පවරනු ලැබිය හැකි ය.

(2) සභාව වෙනුවෙන්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් සභාව විසින් ගෙවනු ලැබිය යුතු ය.

චංචල හා නිශ්චල රජයේ දේපළක් සභාව වෙත ලබාදිය යුතු බව.

24. (1) සභාවේ කාර්යය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ වූ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දෙනු ලබන කාර්යයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එපරිද්දෙන්ම එම ආඥාපනතේ විධිවිධාන, සභාව වෙත දෙනු ලබන ඒ දේපළ පිළිබඳ වූ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) සභාවේ කාර්යය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ඒ චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය සභාවට පැවරීම හා සභාව වෙත සතු කිරීම, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

වාර්තා සහ තොරතුරු.

25. (1) මේ පනතේ 5 වන සහ 6 වන වගන්ති යටතේ සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් යමක් සභාව විසින් ක්‍රියාත්මක කළ හැකි හා ඉටු කළ හැකි වීමේ කාර්යය සඳහා, සභාව විසින් හෝ තත් කාර්යය සඳහා සභාව විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් සියලු වාර්තා හා තොරතුරු ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් ඇතුළත සභාවට හෝ සභාව විසින් බලය දෙන ලද තැනැත්තාට සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට (1) වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, ඒ වාර්තා හෝ තොරතුරු සැපයීමෙන් යම් නීතියක විධිවිධාන යටතේ ඒ තැනැත්තා වළක්වනු ලබන අවස්ථාවක හැර, එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත එම නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියම යන්ට අනුව ක්‍රියා කිරීම වශයෙන් (1) වන උපවගන්තිය යටතේ සපයන ලද වාර්තාවක අඩංගු කිසිම තොරතුරක්, ඒ වාර්තාව හෝ තොරතුර සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව නැතහොත් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ ක්‍රියාවලියේ දී හැර, සභාව විසින් පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට දැනුම්දීම හෝ නොකළ යුතු ය.

සභාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළයුතු බව.

26. එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී සභාව විසින් ඒ වර්ෂය තුළ සභාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පළ කළ යුතු අතර එය අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ පසු ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීමේ බලය.

27. සභාව විසින් තත් කාර්යය සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂ යෙන් බලය දී ඇති සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් යම් පරිගණක හෝ තොරතුරු තාක්ෂණවේදී පිහිටුවීම් ඇති ඉඩ මක හෝ ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට යටත් පිරිසෙයින් තුන් දිනකට කලින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන් පසු ඒ ඉඩමට හෝ ස්ථානයට ඇතුළු වී සභාවේ යම් කටයුත්තක් කිරීමේ හෝ සභාවේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ යම් කර්තව්‍ය යක් ඉටු කිරීමට මූලික හෝ ආනුෂංගික වන යම් විමර්ශනයක් හෝ පරීක්ෂනයක් කිරීමේ කාර්ය සඳහා සාධාරණව අවශ්‍යවන පරීක්ෂණ සෝදිසි කිරීම් සහ ක්‍රියා කරනු ලැබිය හැකි ය.

වැරදි සහ දණ්ඩන.

28. (1) පහත සඳහන් ක්‍රියාවන් කරන, එනම්—

(අ) 25 වන වගන්තිය යටතේ තමා වෙත යවන ලද දැන්වීමක නියමයන්ට අනුව ක්‍රියා කිරීමේ දී තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක දැනුවත්ව අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන;

(ආ) 25 වන වගන්තිය යටතේ තමා වෙත යවන ලද දැන්වීමක නියමයන්ට අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ඇ) 27 වන වගන්තියෙන් යම් තැනැත්තකු වෙත පවරා ඇති බල තල ඒ තැනැත්තා විසින් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ තැනැත්තාට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන; හෝ

(ඈ) සභාවේ සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකුව සිටිමින්, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය ඉටු කිරීමේ දී නැතහොත් ඒ සම්බන්ධයෙන් තමා විසින් ලබා ගන්නා ලද යම් තොරතුරක්, මේ පනත යටතේ ඒ තොරතුර හෙළි කිරීමට තමාට බලය දී ඇති කාර්යය සඳහා හැර යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළි කරන

සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සිදු කරන සෑම තැනැත්තකුම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වේ නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම සහ නිලධරයකුම ද ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වේ නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකුම ද

ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය :

එසේ වුව ද ඒ වරද සිදු කරන ලද්දේ තමා නොදැනුවත්ව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්‍යෝග යෙන් යුතුව ක්‍රියා කළ බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ නිලධරයකු විසින් නැතහොත් ව්‍යාපාරික ආයතනයේ හවුල් කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස නො සැලකිය යුතු ය.

අර්ථ නිරූපණය.

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සංවර්ධන සභාව" යන්නෙන් 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යටතේ පිහිටුවන ලද සංවර්ධන සභාවක් අදහස් වේ;

"තොරතුරු තාක්ෂණවේදය" යන්නෙන් දත්ත සහ තොරතුරු එකතු කිරීම, සම්ප්‍රේෂණය කිරීම හා සකස් කිරීම සඳහා වූ යම් තාක්ෂණවේදයක් අදහස් වේ.

### උපලේඛනය

(4 (3) වන වගන්තිය)

සභාවේ සාමාජිකයන් සම්බන්ධ විධිවිධාන.

1. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ යම් සංවර්ධන සභාවක සභිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වේ නම් හෝ වන්නේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසාන වී ඇත් නම් ; හෝ

(ඇ) සිහිවිකල තැනැත්තකු ලෙස ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ, නිර්ණය කරනු හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත් නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද සිරදඬුවමක් විඳිමින් සිටි නම් හෝ විඳ ඇත් නම්

ඔහු, සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙක් වන්නේ ය.

2. සභාවේ සෑම සාමාජිකයකුම, ඔහු මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුවද මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරන ලද සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ නොගෙවී ඇති ධුර කාලය තුළ ධුරය දරන්නේ ය.

3. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජනාධිපතිවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා, එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ, ධුරය හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

4. සභාවේ යම් සාමාජිකයකු විසින් තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලියවිල්ලක් මගින් භාරගනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

5. මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා සභාවේ යම් සාමාජිකයකු විසින් ධුරය හිස් කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය. ඒ සාමාජිකයා වෙනුවට එසේ පත් කරන ලද යම තැනැත්තකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ නොගෙවී ඇති ධුර කාලය තුළ ධුරය දැරිය යුතුය.

6. රෝගාතුරවීම හෝ අබලතාව නිසා හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාවේ සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එසේ නොහැකිවීම පිළිබඳව ජනාධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම්දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. එවිට ජනාධිපතිවරයා විසින් 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, ඒ සාමාජිකයා වෙනුවෙන් ඒ කාලසීමාව තුළ ක්‍රියා කිරීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික සභාවේ අරමුදලෙන් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

8. (1) සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් පැමිණ සිටින සාමාජිකයන්ගෙන් කෙනකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීම සඳහා තෝරා පත් කළ යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක මුලසුන දරන තැනැත්තාට, ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ ඡේදයේ විධිවිධානවලට යටත්ව, සභාව විසින්, සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධව කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

9. සභාවේ යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් සභාවේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බලරහිත වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

10. (1) සභාව විසින් සභාවේ මුද්‍රාව තීරණය කර සකස් කර ගත හැකි අතර එය සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කර ගත හැකි ය.

(2) සභාවේ මුද්‍රාව සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(3) සභාවේ අනුඥාව ඇතිව ද සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී ද හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට සභාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන තැබිය යුතු ය.

(4) සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් සභාව විසින් තබා ගත යුතු ය.

11. (1) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින් සභාවේ වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසාන කළ හැකි ය.

(3) සභාපතිවරයා විසින් ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලියවිල්ලක් මගින් භාරගනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(4) (2) වන සහ (3) වන අනුඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය සභාවේ ඔහුගේ සාමාජිකත්වයේ කාලසීමාව විය යුතු ය.